# ලංසු සඳහා ආරාධනයයි (IFB)

# විභාග දෙපාර්තමේන්තුව

## Oce' CS 3500Z Inkjet Production Printer සඳහා

## කඩදාසි රෝල් 300 ක් සැපයීමේ ප්‍රසම්පාදනය

### කොන්ත්‍රාත් අංකය : 4/4/4/2018

01. විභාග කොමසාරිස් ජනරාල් වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් Oce' CS 3500Z Inkjet Production Printer සඳහා කඩදාසි රෝල් 300 ක් සැපයීමේ ප්‍රසම්පාදනය සඳහා අවම දෙන ලද පළපුරුද්ද සහිත යෝග්‍යතා පූර්ණ හා සුදුසුකම් ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍ර තබන ලද ලංසු කැඳවනු ලැබේ. සම්පූර්ණ විස්තර ලංසු ලිපිලේඛනවල අන්තර්ගත කර ඇත.

02. ලංසුකරණය, ජාතික තරගකාරී ලංසුකරණ (NCB) පටිපාටිය යටතේ පැවැත්වේ.

03. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු, අසාධු ලේඛනගත නොවී සිටිය යුතු වන අතර, සමාන යන්ත්‍රයක් හෝ Oce' CS 3500Z Inkjet Production Printer සඳහා කඩදාසි රෝල් සැපයීම පිළිබඳ වසර තුනක පළපුරුද්දක් ද තිබිය යුතුය.

04. ලංසුකරු සතුව 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත්තු පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව පොදු කොන්ත්‍රාත්තු රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද වලංගු සහතිකයක් තිබිය යුතුය.

05. අභිලාෂී යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන් හට වැඩිදුර තොරතුරු විභාග දෙපාර්තමේන්තුවේ, 03 වන මහලේ, සැපයුම් අංශය වෙතින් (දුරකථන : 011-2786200 හෝ 011-2785219) මගින් ලබාගත හැකි වන අතර, ලංසු ලිපිලේඛන 2019.04.23 වන දින දක්වා රාජකාරී දිනවලදී පෙ.ව. 9.00 සිට ප.ව. 03.00 දක්වා නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

06. අභිලාෂී ලංසුකරුවන් හට අංගසම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් එක් එක් ලිපි ලේඛනය සඳහා ආපසු ගෙවනු නොලබන රුපියල් 13000/- ක ගාස්තුවක්, මුදලින් ගෙවීමෙන් හා ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ ලිපියේ පිටපතක් සමග ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2019.04.23 වන දින ප.ව. 3.00 දක්වා මිලදී ගත හැකිය. ගෙවීමේ ක්‍රමය මුදලින් වනු ඇත.

07. පූර්ව ලංසු රැස්වීමක්, බත්තරමුල්ල, පැලවත්ත, විභාග දෙපාර්තමේන්තුවේ දී 2019.04.17 වන දින පෙ. ව. 10.30 ට පැවැත්වේ.

08. ලංසු, එම ලංසු විවෘත කරනු ලබන දින සිට දින 120 ක් දක්වා (එනම් 2019.08.22 වන දින දක්වාද) වලංගු විය යුතුය.

09. සියලුම ලංසු සමග ශ්‍රී ලංකා රුපියල් පන්ලක්ෂ හැටදහසක (ශ්‍රී ලං රු 560,000.00) ක වටිනාකමින් යුත්, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් කොන්දේසි විරහිත බැංකු ඇපකරයක් ආකාරයෙන් වන, ලංසු ලිපිලේඛනවල දක්වා ඇති ආකෘතියට අනුව සකස් කරන ලද හා ලංසු ඉදිරිපත් කරනු ලබන දින සිට දින 150 ක් දක්වා (එනම් 2019.09.21 වන දින දක්වා) වලංගු ලංසු සුරක්ෂණයක්ද ඉදිරිපත් කළ යුතුය.

10. ලංසු, 2019.04.24 වන දින ප. ව. 2.30 ට හෝ ඉන් පෙර ලැබෙන සේ බත්තරමුල්ල, පැලවත්ත, විභාග දෙපාර්තමේන්තුවේ, 03 වන මහලේ, සැපයුම් අංශය වෙත ගෙනැවිත් භාර දිය යුතුය. ප්‍රමාද ලංසු විවෘත නොකරම ආපසු යවනු ලැබේ. ලංසු එම ලංසු, භාරගන්නා අවසාන වේලාව ඉක්මවූ වහාම ඉහත සඳහන් ලිපිනයේදී පැමිණ සිටින ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේදී විවෘත කරනු ලැබේ.

11. නිසි පරිදි සම්පූර්ණ කර මුද්‍ර තබන ලද ලංසු ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ "Oce' CS 3500Z Inkjet Production Printer සඳහා කඩදාසි රෝල් 300 ක් සැපයීමේ ප්‍රසම්පාදනය" කොන්ත්‍රාත් අංකය : 4/4/4/2018 යනුවෙන් සඳහන් කර ඉදිරිපත් කළ යුතුය.

12. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ ක්‍රියාමාර්ගය සඳහා එම කරුණ මත ලංසුකරුට හෝ ලංසුකරුවන්ට ඇතිවන බලපෑම් පිළිබඳ දැනුම් දීමට කිසියම් බැඳීම් හෝ බලපානු ලබන ලංසුකරුට හෝ ලංසුකරුවන්ට, කිසිදු වගකීමක් හෝ බැඳීමක් අත්කර දීමකින් තොරව, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙරාතුව, ඕනෑම අවස්ථාවකදී ඕනෑම ලංසුවක් භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සහ සියලු ලංසු ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතුය.

**විභාග කොමසාරිස් ජනරාල්,**
**විභාග දෙපාර්තමේන්තුව,**
**පැලවත්ත, බත්තරමුල්ල.**
**2019.04.03**